**ශීර්ෂය - 280 - ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව**

-----------------------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

---------------------------------

ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි **29** දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 අගෝස්තු 16 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත .මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

----------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මෙම වාර්තාවේ 1.6.1 (ඇ) ඡේදයෙන් දැක්වෙන කරුණු හැර මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ආදායම් නොවන ලැබීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අග්‍රිම ලැබීම රු.91,558,475 ක් වුවද එය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි රු.91,370,000 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.188,475 ක වෙනසක් නිරීක්ෂණය විය. | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ලද අග්‍රිමය රු. 91,370,000 කි. අප විසින් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ලද අග්‍රිම පිළිබඳ ලේඛනය ඔබ වෙත විගණනය සඳහා ලබාදී තිබූ අතර තවදුරටත් තහවුරු කිරීම සඳහා එම ලේඛනයේ පිටපතක් ඇමුණුම 1 ලෙස මෙම ලිපියට අමුණා ඇත. | අග්‍රිම ලැබීම මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ඉදිරිපත් කළයුතු වීම. |

### 1.6.2 මූල්‍ය නොවන වත්කම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) යන්ත්‍ර හා උපකරණ වෙනත්, ආරම්භක ශේෂය මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයට අනුව රු. 23,715,603 ක් ද, භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව එය රු.26,565,129 ක් වීමෙන් රු. 2,849,526 ක වෙනසක් නිරීක්ෂණය විය. | වත්කම් වර්ග අනුව වටිනාකම වෙනස්වුවද සමස්ථ වත්කම්වල වටිනාකම ඒසීඒ 6 හි සහ ඒසීඑස් 82 හි සමානය. | මූල්‍ය නොවන වත්කම් සටහන් කිරීමේදී ආරම්භක ශේෂය,මිලදී ගැනීම්, අපහරණයන් හා අවසාන ශේෂ නිවැරදිව වාර්තා කිරීමට කටයුතු කළයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඉහත උපකරණ අත්පත් කරගැනීමේ ශේෂය (මාරුකිරීම මඟින්) මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයට අනුව රු. 2,763,525 ක් ලෙස දැක්වුවද භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව ශේෂයක් නොපෙන්වයි. | -එම- | මූල්‍ය නොවන වත්කම් සටහන් කිරීමේදී ආරම්භක ශේෂය,මිලදී ගැනීම්, අපහරණයන් හා අවසාන ශේෂ නිවැරදිව වාර්තා කිරීමට කටයුතු කළයුතු වීම. |
| (ඇ) | ඉහත උපකරණ අපහරණයන්ගේ ශේෂය (මාරුකිරීම මඟින්) මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ රු. 1,353,346 ක් ද, භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව රු. 1,439,347 ක් ද වීමෙන් රු. 86,001 ක වෙනසක් නිරීක්ෂණය විය. | -එම- | මූල්‍ය නොවන වත්කම් සටහන් කිරීමේදී ආරම්භක ශේෂය,මිලදී ගැනීම්, අපහරණයන් හා අවසාන ශේෂ නිවැරදිව වාර්තා කිරීමට කටයුතු කළයුතු වීම. |
| (ඈ) | 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනය හා භාණ්ඩාගාරය මුද්‍රිත සටහන් පරීක්ෂා කිරීමේදී කාර්යාල උපකරණ ශේෂය රු.2,635,432 කින් ද පරිගණක උපකරණ ශේෂය රු.789,828 කින් ද විද්‍යුත් උපකරණ ශේෂය රු.335,500කින් ද හා ගෘහ භාණ්ඩ උපකරණ ශේෂය රු.1,510,103 කින් ද වෙනස් වී ඇති බව නිරීක්ෂණය විය. | -එම- | මූල්‍ය නොවන වත්කම් සටහන් කිරීමේදී ආරම්භක ශේෂය,මිලදී ගැනීම්, අපහරණයන් හා අවසාන ශේෂ නිවැරදිව වාර්තා කිරීමට කටයුතු කළයුතු වීම. |
| (ඉ) | වටිනාකම රු.4,995,000 ක් වූ මෝටර්රථ දෙකක් වෙනත් ආයතන වෙත පැවරීම් කර තිබූ නමුත් එය මූල්‍ය ප්‍රකාශණ වලින් ඉවත් නොකිරීම නිසා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | එකඟ වෙමි. නිවැරදි කිරීමට කටයුතු කරමි. | මූල්‍ය නොවන වත්කම් නිවැරදිව ගිණුම්ගත කිරීමට පියවර ගැනීම. |
| (ඊ) | ඩබල් කැබ් රථයේ වටිනාකම වූ රු.7,530,000 ක් වූ ස්ථාවර වත්කම් ලේඛනයේ රු. 4,800,000 ක් ලෙස සටහන් කිරීම හේතුවෙන් රු.2,730,000 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |

### 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශ

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රවර්තන වර්ෂය තුළ භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිමය රු. 91,558,475 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි භාණ්ඩාගාරයෙන් ලද අග්‍රිමය රු.91,370,000 ක් ලෙස දැක්වීම හේතුවෙන් ශුද්ධ මුදල් ප්‍රවායෙහි රු.188,475 ක වෙනසක් නිරීක්ෂණය විය. | එකඟ වෙමි. | මුදල් ප්‍රවාහයන් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වීම. |
| (ආ) | භාණ්ඩාගාර පොත් අනුව භාණ්ඩාගාරයට පියවිය යුතු ශේෂයක් පෙන්වා නොතිබිය දීත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි භාණ්ඩාගාරයට පියවන ලද මුදල රු.76,673 ක් ලෙස දක්වා තිබුණි. | එකඟ වෙමි. | -එම- |

### 1.6.4 අක්මුදල් ගැලපුම් ගිණුම

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අග්‍රිම ගැලපුම් ගිණුමට ගැලපිය යුතු අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.1,217,925 ක් වුවද එය 1,029,450 ක් ලෙස ගැලපීම හේතුවෙන් රු.188,475 ක වෙනසක් නිරීක්ෂණය විය. | දේපළ ණය මුදලක් නිරවුල් කිරීම සඳහා රු. 188,475/- ක මුදල ලැබී තිබුණි. එවැනි ලැබීම් අග්‍රිම ගැලපුම් ගිණුමට ගැලපීම් නොකරන අතර එක් එක් දෙපාර්තමේන්තු අතර හරස් සටහන් මගින් ණය ශේෂ නිරවුල් කිරීම් පමණක් අක් මුදල් ගැලපීම් ගිණුමට ඇතුළත් කරනු ලබයි. ඒ අනුව අක් මුදල් ගැලපුම් ගිණුම නිවැරදිව සකස් කර ඇත. | භාණ්ඩාගාර මුද්‍රිත හා දෙපාර්තමේන්තු පොත් සසඳමින් අග්‍රිම ගැලපුම් ගිණුම සකස් කළයුතුවීම. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව භාණ්ඩාගාරයට නිරවුල් කළ යුතු ශේෂයක් දක්වා නොමැති වුවද නිරවුල් කලයුතු අග්‍රිම ගිණුමේ රු. 76,673 ශේෂයක් දක්වා තිබුණි. | 2020.12.31 දින භාණ්ඩාගාරයට නිරවුල් කල යුතුව තිබූ මුදල එදිනම නිරවුල් කිරීම හේතුවෙන් භාණ්ඩාගාර පොත්වල ශේෂයක් නොපෙන්වයි. | ගිණුම් පිළියෙල කිරීමේදී නිවැරදි දත්ත පිළියෙල කිරීම. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී වැය විෂයන් 06කට අදාලව රු.2,900,000 අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් එම ප්‍රතිපාදන උපයෝජනය කල පසු රු.909,183 ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 13 සිට සියයට 79 ක පරාසයක් ප්‍රමාණය වී තිබුණි. | 2020 වර්ෂයේ ඇතිවූ කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම් කල කටයුතු ඒ ආකාරයෙන්ම ඉටු කිරීමට නොහැකිවූ බැවින් ප්‍රතිපාදන ඉතිරිවීම් හා ප්‍රතිපාදන මාරු කිරීම් සිදු කිරීමට අවශ්‍ය විය. කෙසේවෙතත් දෙපාර්තමේන්තුවට වෙන් කරනු ලැබූ ප්‍රතිපාදන වලින් 96% ක් වියදම් කර ඇත. | වාර්ෂික ඇස්තමේන්තු තාත්වික හා ඵලදායී ලෙස සකස් කිරීමට පියවර ගැනීමේ අවශ්‍යතාවය |

### 2.2 බැරකම් පිළිබඳ ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) භාණ්ඩාගාර මුද්‍රිත සටහන් පත්‍රිකා අංක SA – 92 අනුව 2020 දෙසැම්බර් 31 දින දක්වා රු. 820,000 ක බැරකම් වාර්තා කර තිබුණු අතර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ එය රු. 535,735 ක් ලෙස සටහන් කර තිබීම හේතුවෙන් රු.284,265 ක වෙනසක් නිරීක්ෂණය විය. | එකඟ වෙමි. | බැරකම් හා බැඳීම් නිසිපරිදි සටහන් කිරීම හා ඉදිරිපත් කිරීම. |
| (ආ) භාණ්ඩාගාර මුද්‍රිත සටහන් SA – 92 හි දක්වා ඇති රු.170,000 වූ බැරකම්, මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබූ බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ සඳහන් කර නොතිබුණි. | එකඟ වෙමි. | -එම- |
| (ඇ) මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව (සැපයීම හා සේවා නොවන) ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට නොබැඳි සිටිය යුතු වුවද, වැය විෂයකට අදාලව ප්‍රතිපාදන ඉක්මවා රු. 35,160 ක බැරකම් වලට එළඹී තිබුණි. | එකඟ වෙමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv වෙනි පරිච්ඡේදයේ 4.5 හා 4.6 ඡේද | සේවය අතහැර ගොස් ඇති නිලධාරීන්ගේ ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කල යුතු වුවද, දෙපාර්තමේන්තුවේ සේවය අතහැර ගොස් ඇති නිලධාරියෙකුගෙන් අයවිය යුතු ශේෂය වූ රු. 139,921 ක් වර්ෂ 5 ක කාලයක සිට අයකර ගෙන නොතිබුණි. | සේවය අතහැර ගොස් ඇති එම්.එස්.පී. පෙරේරා මහතාගෙන් අයවිය යුතු රු. 139,921 ක මුදල අයකර ගැනීමේ කටයුතු 2015.09.03 දින සිට ආරම්භ කර ඇත. අද දින වන විට මේ සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව විසින් නෛතික කටයුතු සිදුකරමින් පවතී. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කලයුතුවීම. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 880 | ඇප තැබිය යුතු නිළධාරීන් විසින් ඇප තැන්පත් තබා නොතිබුණි. | ඇප තැබිය යුතු නිලධාරීන් විසින් ඇප තැබීමට ඉදිරියේදී කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම. |
| (ඇ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මානව සම්පත් සැලැස්ම පිළියෙල කර නොතිබුණු අතර සමස්ත කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්ය සාධන ගිවිසුම ද අත්සන් කර නොතිබුණු. | ඉහත චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂය සඳහා මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබූ බව පිළිගනිමි. එහෙත් මේ වනවිට මෙම දෙපාර්තමේන්තුව සඳහා මානව සම්පත් සැලැස්මක් සකස් කරමින් පවතී. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීම. |
| (ඇ) | අංක **2/2020** දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ **10.1** ඡේදය සහ රාජ්‍ය ගිණුම දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල මාර්ගෝපදේශ අංක **6** ඡේදය | මුදල් ප්‍රවාහ ප්‍රකාශය දළ පදනමට සැකසිය යුතු වුවද, එය මුදල් පදනමට සකසා තිබුණි.<br>(i) දෙපාර්තමේන්තු පොත් අනුව ආදායම් නොවන ලැබීම් රු.3,638,022 ක් වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි රු.24,059 | එකඟ වෙමි. කෙසේවුවද මේවන විට සංශෝධිත මුදල් ප්‍රවාහ ප්‍රකාශය භාෂාත්‍රයෙන් සකස් කර අපගේ 2021.05.12 දිනැති ලිපිය සමඟ ඔබ වෙත ඉදිරිපත් කර ඇත | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| | | ක් ලෙස දැක්වීම හේතුවෙන් ශුද්ධ මුදල් ප්‍රවාහය රු.3,613,963 ක් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| | | (ii) දෙපාර්තමේන්තු පොත් අනුව ප්‍රවර්තන වර්ෂයේ පුනරාවර්ථන වියදම රු.92,329,778 ක් වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි රු.85,649,914 ක් ලෙස දැක්වීම හේතුවෙන් ශුද්ධ මුදල් ප්‍රවාහය රු.6,679,864 ක් වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| | | (iii). දෙපාර්තමේන්තු පොත් අනුව අත්තිකාරම ලැබීම් රු.4,601,462 ක් වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි රු.192,475 ක් ලෙස දැක්වීම හේතුවෙන් ශුද්ධ මුදල් ප්‍රවහය රු.4,408,987 ක් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| | | (iv) දෙපාර්තමේන්තු පොත් අනුව අත්තිකාරම් ගෙවීම රු.3,620,362 ක් වුවද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි රු.2,088,800 ක් ලෙස දැක්වීම හේතුවෙන් ශුද්ධ මුදල් ප්‍රවාහය රු.1,531,362 ක් වැඩියෙන් දක්වා තිබුණි. | | |
| **(ඉ)** | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සෑම මුදල් වර්ෂයකම මාර්තු 17 දිනට පෙර පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත යොමු කළ යුතු වුවත්, 2020 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2021 මැයි 21 දිනය වන විටත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර ඇත. වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | -එම-. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 සැලසුම් කිරිම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ක්‍රියාකාරි සැලැස්ම<br><br>2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම තුළ වර්ෂයට අදාලව යාවත්කාලීන කරන ලද දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය, අනුමත හා තථ්‍ය කාර්යමණ්ඩලය පිළිබඳ විස්තර හා වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා අක්මුදල් අවශ්‍යතා සැලැස්ම අන්තර්ගත කර නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කර නොතිබූ පෙන්වා දී ඇති විස්තර ඉදිරි ක්‍රියාකාරී සැලැස්ම සකස්කිරීමේදී ඇතුලත් කිරීමට කටයුතු කරමි. තවද දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය දැනටමත් යාවත්කාලීන කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |
| (ආ) 2020 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලැස්මෙහි ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලට ගැනීමට අවස්ථාවක් නොතිබුණද, වැය ශීර්ෂ අංක 2102 යටතේ ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මිලට ගැනීමට රු. 500,000 ක් ප්‍රතිපාදන වෙන්කරගෙන තිබුණි. ඒ සඳහා රු. 218,320 ක් වියදම් දරා තිබුණු අතර මුළු ප්‍රතිපාදනයෙන් සියයට 44 කි ඒ අනුව ඉතිරිය සියයට 56 ක් වී තිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම සකස් කරන අවස්ථාව වන විට කාර්යාලය සඳහා භාණ්ඩ මිලදී ගැනීමට අවශ්‍යතාවයක් නොතිබිණ. එහෙත්, 2020 වර්ෂයේ ජූලි මාසය වන විට මෙම දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාර ගොඩනැගිල්ලේ ස්ථාපිත කිරීම සිදු විය. ඒ අනුව, කාර්යාලයීය කාමර වලට ගැලපෙන පරිදි අත්‍යාවශ්‍ය කාර්යාලයීය ගෘහ භාණ්ඩ මිලදී ගැනීමට කටයුතු කර ඇත. | ප්‍රසම්පාදන සැලසුම් අවශ්‍යතාවයන්ට අනුකූලව සකස්කිරීමට පියවර ගතයුතුවීම. |

**3.1.2. කළමනාකරණ දුර්වලතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අවුරුදු දෙකකට වැඩි කාලයක් දෙපාර්තමේන්තුව විසින් භාවිතා කර තිබූ අංක KN – 2496 දරණ මෝටර් රථය, දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | WP KN 2496 දරණ මෝටර් රථය පවරා ගැනීමට අදාළ ලියවිලි මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත. | මූල්‍ය නොවන වත්කම් නිසි පරිදි කළමනාකරණය කිරීමට කටයුතු කළයුතුවීම. |

**4. මානව සම්පත් කළමනාකරණය**

**4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව තුල අනුමත තනතුරු 107 ක් පැවතියද තත්‍ය කාර්ය මණ්ඩලය 70ක් පමණක් විය. ඒඅනුව තනතුරු 37 ක පුරප්පාඩු පැවති අතර එය අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 35 ක ප්‍රතිශතයක් විය. එම පුරපුපාඩු තුල ජ්‍යේෂ්ඨ මට්ටමේ තනතුරු 09 ක්, තෘතික මට්ටමේ තනතුරු 04 ක් හා ද්විතීක මට්ටමේ තනතුරු 20 ක්ද පවතින බව නිරීක්ෂණය විය. | මෙම දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු දැනුම්දීමට කටයුතු කර ඇත. තවද, අනපේක්ෂිත ලෙස ඇති වූ කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ඇති වූ අපහසුතා හමුවේ මෙම වර්ෂයේ දී මේ සම්බන්ධයෙන් නැවතත් රාජ්‍ය සේවා, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය දැනුවත් කිරීමට අවස්ථාවක් නොවුණි.<br>පුරප්පාඩු පැවතුණද පවත්නා කාර්ය මණ්ඩලය උපයෝගී කරගෙන දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීමට උපරිම උත්සාහය දරා ඇත. | දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව විධිමත් පරිදි පවත්වා ගැනීමට කටයුතු කලයුතුවීම. |